# තුන් පිම් පනින ශ්‍රීලංකාවේ දේශපාලකයෝ



S. B.
Anura B.
Ronnie de M.
Karu Jaya
Rajitha S.
Rauf Hakeem








පසුගියදා ලන්ඩනයේ පැවති ගී ප්‍රසංගයකදී නන්දා මාලිනී සහ රෝහණ වීරසිංහ එක්ව ගායනා කළ රත්තරන් දුවේ ගීතයට ප්‍රේක්ෂක ප්‍රතිචාරය මහත් ඉහළින් ලැබිණ. මෙම ගීතයෙන් කියැවෙන්නේ මහගෙදර හැරදමා වෙනත් ගෙදර කට පියමං කළ දියණියට නැවත මහගෙදරට පැමිණෙන්නට කරන දයාබර ආයාචනයකි. මෙය අප සිංහළ සමාජයේ ලක්ෂණයක් වෙයි. දේශපාලන ක්ෂෙත්‍රයේද විවිධ හේතූන් මත මහගෙදර හැරදමා වෙනත් දේශපාලන ගෙවල්වල ලැගුම්ගෙන නැවත මහගෙදරට සේන්දු වන දේශපාලනඥයින්ද අද අප රටේ සුලභ දර්ශනයක් බවට පත්ව ඇත.

දේශපාලනයේ සදාකාලික මිතුරන් හෝ සතුරන් නැතැයි යනුවෙන් සුප්‍රකට කියමනක් තිබේ. ඒ න්‍යාය කටට හුරු කරගනිමින් එහෙ මෙහෙ පනින මැති ඇමතිවරු, තමන් පැන්නේ ඇයිදැයි යන්න පසුව සාධාරණීකරණය කරන්නේ ඉහතකී කියමනෙන් එම ප්‍රශ්න ඇසූවන්ට පිළිතුරු දෙමිනි.

පක්ෂයක් හැරගොස් නැවත මුල් පක්ෂයට හැරී එන දේශපාලක යින්ගේ හැසිරීමේ විශේෂත්වයක් වෙයි. ඔව්හු දේශපාලන මුල් ගෙදර හැරපියා ගොස් එහි ඇතුළත පෞද්ගලික තොරතුරුද රහස්‍ය සැළසුම්ද හෙළිකරමින් මහගෙදර ඇත්තන් දැඩිලෙස විවේචනය කර මින්, ආඩපලි අපවාද නගමින්, අළුත් මහගෙදරකට රිංගා ගනිති. ටික කලකට පසු ඔවුන් කරන්නේ කුමක්ද? තමන්ට ලැගුම් දුන් අළුත් ගෙදරට පයින් ගසා ගෘහමූලිකයන් ගේ තොරතුරුද, සැළසුම්ද හෙළ කොට පෙරසේම සිටි තැනට ආඩ පලි කියමින් අපවාද නගමින් නැවත මුල් මහගෙදරට එක් වීමයි. විටෙක ගෘහමූලික තත්වයද සැලසූ නායක යින්ගේ ඇතුළු යහන් ගබඩාවලට ද රිංගා නායකත්වයට පවා මහ සලසා ගත් මොව්හු කිසිදු හිරිකිත යක් නොමැතිව තුන් පිම් පනිති.

ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණ වේදිකාවල දක්නට ලැබෙන මෙවැනි දේශපාලකයින්ගේ ප්‍රකාශ සහ දේශනද අරුම පුදුමය. එක්වරක් දේශපාලන පිල් මාරුකොට එයින් නොනැවතී දෙවන වරටද පිල්මාරු කරන්නන් පිළිබඳව ජනතාව විමසිලිමත් විය යුතුය. ආසියාවේ රටවල, විශේෂයෙන් වැඩිපුරම ශ්‍රී ලංකාවේ එසේ තුන් පිම් පනින දේශපාලකයින් ඇතත් යුරෝපීය රටවලද මහා බ්‍රිතාන්‍යයේද එවැන් නන් විරලය. මහා බ්‍රිතාන්‍යයේ සිරිත නම් කලාතුරකින් එසේ පක්ෂයක් අත්හැර ගිය කෙනෙකු කරන්නේ ස්වාධීනව කටයුතු කිරීම හෝ නිහඬව සිටීම විනා වෙනත් දේශ පාලන මහගෙදරකට රිංගා මුල් පක්ෂයේ නායකයින් දැඩිලෙස විවේචනය කිරීම නොවේ.

**ඔව්හු දේශපාලන මුල් ගෙදර හැරපියා ගොස් එහි ඇතුළත පෞද්ගලික තොරතුරුද රහස්‍ය සැළසුම් ද හෙළිකරමින් මහ ගෙදර ඇත්තන් දැඩිලෙස විවේචනය කර මින්, ආඩපලි අපවාද නගමින්, අළුත් මහ ගෙදරකට රිංගා ගනිති. ටික කලකට පසු ඔවුන් ........**

ශ්‍රීලංකාවේ තුන් පිම් දේශපාලනය ආරම්භවන්නේ 1956 දී පමණය. 1951 දී ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක සමග එජාපය හැරදමාවිත් ශ්‍රීලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගැන්මට උරදුන් මාතලේ බර්නාඩ් අළුවිහාරේ එම පක්ෂයේ ලේකම් වරයාද විය. 1956 මහා මැතිවරණ නාම යෝජනා දිනට පෙර ඔහු පැදුරටත් නොකියාම නැවත එක්සත් ජාතික පක්ෂයට එක්විය.

රොනී ද මැල්, විජයානන්ද දහනායක මෙලෙස පිල් මාරු කළ ප්‍රමුඛයින් වන අතර එස්. තොන්ඩමන් තම පක්ෂය පිටින්ම තුන් හතර වතාවක් එහාට මෙහාට හේත්තු විය.

මෑතකදී මෙලෙස දේශපාලන තුන් කරණම් ගැසූ අය අතර ජිනදාස නියත පාල, අනුර බණ්ඩාරනායක, තිලක් කරුණාරත්න, ජී. ඇල්. පීරිස්, ගාමිණී දිසානායක, රාජිත සේනාරත්න, හේම කුමාර නානායක්කාර, රවුෆ් හකීම්, එස්. බී. දිසානායක, නන්දිමිත්‍ර ඒකනායක සහ මර්වින් සිල්වා ද වෙති

කරු ජයසූරිය, ජී. එල්. පීරිස්, ගාමිණී දිසානායක පක්ෂය මාරු කරන විටත්, නැවත පැරණි පක්ෂයට පැමිණි විටත් තම පක්ෂයේ කටයතු දැඩි ලෙස විවේචනය නොකළ බව කිව යුතුය.

2001 වන විට එස්. බී. දිසානායක ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ ප්‍රධාන ලේකම් ධූරය දැරූ අතර පොදු පෙරමුණු රජයේ ප්‍රබල චරිතයක් විය. ඔහු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ සමීප තම සගයා වීය. එසේම එස්. බී. ගේ බිරිඳ චන්ද්‍රිකා කුමාරණතුංග බස්නාහිර පළාත් මහ ඇමති වූ සමයේදී ඇයගේ පෞද්ගලික ලේකම්වරිය ද වූවා ය.

2001 දී එස්. බී. දිසානායක එක්සත් ජාතික පක්ෂයට මාරුවී චන්ද්‍රිකා ජනාධිපතිනිය සහ එම රජයේ ප්‍රතිපත්ති නිර්දය ලෙස විවේචනය කරමින් දැඩි ලෙස පහරදුන්නේය. 2005 මහින්ද රාජපක්ෂ ජනාධිපති අපේක්ෂකයා ලෙස ඉදිරිපත්වන විට බන්ධනාගාර ගතව සිටි එස්. බී. දිසානායක සිතින්, කයින්, වචනයෙන් සහාය වූවේ ද රනිල් වික්‍රමසිංහටය. පසු කලෙක ඔහු එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ද අපේක්ෂා කළේ ය.

එස්. බී. පසුගිය මස දෙසැම්බර් 4 වෙනි දා තෙක්ම මහින්ද රාජපක්ෂ රජයද, එහි සහෝදරවරුන් ගැන ද, සන්ධාන රජයේ ප්‍රතිපත්ති ගැන ද නිර්දය ලෙස විවේචනය කළා පමණක් නොව ජෙනරාල් සරත් ෆොන්සේකාගේ පොදු අපේක්ෂකත්වය ද පිළිගත්තේ ය. ජෙනරාල් දිනවීමට ඔහුව කර තබාගෙන රට වටා යන බව පැවසූ එස්. බී. ඊට පැය 48 කට පසුව කළේ කුමක්ද? වවුල් දේශපාලනයට හුරු පුරුදු තුන් පිම්ම පැන නැවත මහගෙදරට හේත්තු වීමයි.

වඩාත් අරුමය වන්නේ මෙවැනි මිනිසු-න් පක්ෂය මාරු කළ සැනින් එතෙක් ඇදහූ පක්ෂ ප්‍රතිපත්ති නයාට අඳුකොළ මෙන් ඉවත ලීමයි. වසර නවයක් තිස්සේම කළ කී දේ අංශක 180 කින්ම කරකැවීමයි. චන්දදායකය-න්ද මොවුන්ට රැවටීම හා මොවුන් හරසරින් පිළිගැනීම ද පුදුමයකි. පෞද්ගලික වාසිය තකා මෙසේ පක්ෂය මාරුකරන්නන් ගැන ජනතාව බුද්ධිමත්ව කල්පනා නොකිරීම සහ ඔවුන් පසු පස අවි චාරවත් ලෙස යෑම අප රටේ දේශපාලනයේ අද ඇති විශාලම වැරැද්දය. අඩුපාඩුවය.

මෙසේ දේශපාලන පිණුම් ගසන අය හෝ ඔවුන්ගෙන් බැටකන කිසිදු පක්ෂයක් මේ වනතුරු පක්ෂ මාරු පිළිබඳව පාඩම් ඉගෙන ගෙන නැත. පක්ෂයක් මාරු කොට එහි ප්‍රතිපත්ති විවේචනය කිරීමේදී සංයමයක් තිබිය යුතුය. ඒවා කිසි විටෙකත් පෞද්ගලික අභිමතාර්ථයන් මත සිදු නොවිය යුතුය. එසේම තමාට සෙවන දුන් අතදුන් නායකයන්ගේ පෞද්ගලික තොරතුරු හෙළි නොකළ යුතුය. දුන් අත සපාකෑම ගුණමකු නොහාබිනාකමක් බව අමුතුවෙන් කිවයුතු නොවේ.

ශ්‍රීලංකාවේ දැනට තිබෙන ප්‍රධානතම දේශපාලන පක්ෂ දෙක වනුයේ ශ්‍රීලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂයයි. මෙම පක්ෂ දෙකේ වත්මන් නායකයින් වන මහින්ද රාජපක්ෂ සහ රනිල් වික්‍රමසිංහ දෙදෙන කිසිවිටෙකත් තම මුල් පක්ෂය හැරදමා නොගිය නායකයන් බව ඔවුන්ට ගෞරව වශයෙන් මෙහි සඳහන් කරමි. එසේ වීම ශ්‍රීලංකාවේ භාග්‍යයකි.

***ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරී***
***♦ මේජර් වී. බී. කරුණාරත්න***
**Oxford - UK**



# වවුලා දේශපාලනයට ආ දවස

එක් කලෙක පක්ෂීන් හා සිව්පාවුන් අතර විශාල යුද්ධයක් ඇතිවිය. දෙපිළකට බෙදුණු ඔව්හු කඳවුරු දෙකක ඉඳ මුහුණට මුහුණ ලා සටන් කරන්නට සූදානමින් බලා සිටියෝය. සටන ආරම්භ විය. පක්ෂීන්ගේ පිළ පරාජයට පත්වෙමින් සිව්පාවුන්ගේ පිළ දිනන්නට යන බව පෙනිණ. මේ වෙලේ වවුලා සිව්පාවුන් සිටින කඳවුරට පියාඹා ගොස් එහි අත්තක වැහුවේය. උඹ අපේ හතුරෙක් උඹ මොකද අපේ පැත්තට ආවෙ සිව්පාවෙක් ඇසූහ

ඇයි එහෙම අහන්නෙ? මම සිව්පාවෙක් බව උඹලා දන්නෙ නැද්ද? මම ඉන්නෙ මට අයිති කඳවුරේ

ඒක හරි කතාවක් නේ. උඹ කොහොමද සිව්පාවෙක් වෙන්නෙ? නිකං පලයං මැරුම් කන්නෙ නැතුව. සිව්පාවෝ දෙන්නෙක් වව්ලාට පහර දෙන්නට ඉදිරියට ආහ.

නෑ නෑ මං කියන්නෙ ඇත්ත. මං පැටවුන්ට කිරි දෙනවා. කිරි දෙන්නෙ සිව්පාවො. කුරුල්ලො කිරි දෙන්නෙ නැහැ නේ. ඒ කාරණයෙන්ම හිතා ගන්න බැරිද මං සිව්පාවෙක් කියලා.

ඒකත් ඇත්ත තමයි ගහන්නට ඉදිරියට පැන්න ඌරුමීයෙක් කීවේය. ඇත්ත තමයි උඹ පැටවුන්ට කිරි දෙනවා නේ. අපටයි වැරදුනේ අනේ සොරි අපට සමාවෙයන්. සිව්පා-වෝ එක හඬින් කීහ.

දින දෙකකට පමණ පසු සිව්පාවුන් පරදින ලකුණු පෙනෙන්නට වණ. වවුලා වහා පක්ෂීන් සිටින කඳවුරට පියඹා ගියේය. ඒ වන විට වවුලා සිව්පා කඳවුරේ සිටි බව පක්ෂීන්ට ආරංචි වී තිබිණ.

තෝ අර පිලේ එකෙක් තෝ මොකටද මෙහේ ආවෙ කුරුල්ලෝ වවුලාට එරෙහිව අවි අමෝරාගත්හ

උඹලට පිස්සුද යකෝ මං කුරුල්ලෙක් නේ මෙහේ නේ මං ඉන්න ඕන මේක නේ මගේ වවුල් නිජබිම නිජබිම ? තොට දෙනවා නිජබිමක් දෙපැත්තට පනින පාහරයා... පල යන්න...

කුරුල්ලෝ වවුලාට කොටා එළවා දැමූහ. වවුලා යළිත් සිව්පා කඳවුර වෙත ගියේය. ඒ වන විට වවුලාගේ පක්ෂ මාරුව සිව්පාවුන්ට වැටහී තිබිණ. සිව්පාවෝ එක් වී වවුලාට පහර දුන්හ. තෝ අපිව රැවැට්ටුවා... තෝ වාසි පැත්තට පනින එකෙක්.... පළයන්න... මේ හතර මායිමට ආයිත් හෙම තෝ ආවොත් මරණනවා... සිව්පාවෝ වවුලා පහරදී එළවා දැමූහ. වවුලාට දෙපැත්තම නැතිවිය. එදා සිට වවුලා කිසිදු කඳවුරකට බාර නොගනී. ඌ අනික් කුරල්ලන්ගෙන් හා සිව්පාවුන්ගෙන් වෙන්ව තනිවම වෙසේ

වාසි පැත්තට පනින අයට වවුලා යයි පට බැඳුණේ එදා සිටය. වවුලාට ස්ථිර ප්‍රතිපත්තියක් නැත. අප රටේ පමණක් කොපමණ දේශපාලන වවුල්ලු සිටිත්ද ?

**♦ වෙනුර**

